

# ලෝකාලෝකය

2017 සැප්තැම්බර් - නොවැම්බර් කලාපය

**දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සුදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ. (2 තිමෝති 3:16)**

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

# දේව වචනය කටපාඩම් කල යුත්තේ ඇයි?

**ස්වාමීන්වහන්සේගේ ව්‍යවස්ථාවේ ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දහවල් මෙනෙහි කරන්නාවූ මනුෂ්‍යයා ආශිර්වාද ලද්දේය. (ගීතාවලිය 1:2)**

දේවානුභාවයෙන් දුන් දේවවචනය නොහොත් බයිබලය පිළිබඳ කළ යුතු එක දෙයක් වන්නේ එය කටපාඩම් කිරීමයි. එනම් භාවනා කිරීමයි. නමුත් කිතුණු භාවනාවේදී කරනු ලබන්නේ දේව වචනයෙන් සිත පුරවා ගැනීමයි. එනම් හැකි පමණ ප්‍රමාණයක් බයිබල් පද කටපාඩම් කිරීමයි. එයින් සිත පිරුණු විට කිසි නපුරු සිතුවිල්ලකට අපගේ සිතට ඇතුල් විය නොහැක. එය වඩා අපගේ සිතට ආරක්ෂාකාරී වේ.

ඇයි අප දේව වචනය කටපාඩම් කළ යුත්තේ?

01. ඕනෑම විටකදී මෙනෙහි කිරීමට උපකාරී වේ. (වමාරා කෑම වැනිය) (ගීතාවලිය 1:2 / 119:27)

02. අපගේ ඇදහිල්ල ශක්තිමත් වේ. රෝම 10:8-11 (මනසේ තිබෙන වචනය අප තුල අපට ඇසෙයි.)

03. අප අවට සිදුවන සෑම දෙයක්ම දෙවියන්වහන්සේගේ දෘෂ්ඨි කෝණයෙන් දැකිය හැකිය. (රෝම 12:1) (මනස තුල ඇති දේව වචනය තුලින් ලෝකයේ සිදුවීම් පේරණය කරයි. (Filter)

04. පව්කිරීමට ඇති අවස්ථාවන් හා පරීක්ෂාව ජය ගැනීමට හැකි වේ. (ගීතාවලිය 119:11 / මතෙව් 4:1-11)

05. තමන්ගේම පාප කැඩපතකින් මෙන් තමාට පෙන්වා දෙයි. (යොහාන් 8:44)

06. යක්ෂයාට එරෙහිව පහරදීමට හැකි වීම. (හෙබ්‍රෙව් 4:12) (මතෙව් 4:1-11) (ගීතාවලිය 119:103) යක්ෂයා දේව වචනයට භය බැවින් ඔහුට එරෙහිව ආයුධයක් ලෙස පාවිච්චි කල හැකිය. එමගින් මටත්, මගේ පවුලටත්, මගේ සභාවටත් මහත් ආරක්ෂාවක් ගෙන දිය හැක.

07. දෙවියන්වහන්සේ සමග තිබෙන රහසිගත සම්බන්ධතාවය දියුණු වන අතර ආරක්ෂාවද සැලසේ. (යොහාන් 15:4) (නිරන්තරයෙන් දේවවචනය සිහිවන විට උන්වහන්සේගේ ළංව වැඩ සිටීම හා විද්‍යාමානභාවය අත්දැකිය හැක.)

**- ජීවන හඬ -**



# ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා පසුකර, සම්පූර්ණ වීමට පැමිණෙමු. (හෙබ්‍රෙව් 6 :2)

ප්‍රිය සහෝදර සහෝදරියනි, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවද, දෙවියන්වහන්සේගේ ප්‍රේමයද, ශුද්ධාත්මයාණන්වහන්සේගේ සැනසිල්ලද ඔබ සමඟ වේවා! යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම ආසන්නයේ සිටින අප ප්‍රායෝගික වූත්, සත්‍ය ඉගැන්වීමෙන් පූර්ණව, පරිණත ඇදහිලිවන්තයන් වීමේ අවශ්‍යතාවයක් සෑම තැන්හීම දක්නට ලැබේ. අද පාවුල් තුමා හෙබ්‍රෙව්වරුන්ට මතක් කර දුන් ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා හය පිළිබඳව සැලකිලිමත් වීම අප සියලු දෙනාටම අති වැදගත් වේ.

### ක්‍රිස්තුස්වහන්සේගේ මුල් කාරණා - (හෙබ්‍රෙව් 6:1-12)

### 01 මළ ක්‍රියාවන් ගැන පසුතැවිලි වීම.

කිතුණු ඇදහිල්ලේ දොරටුව නම් අපගේ පාප පිළිබඳ පසුතැවිලි වීමයි. පාපයේ කුලිය ආත්මික මරණය ලෙස (රෝම 6:23) අවධාරණය කරයි. තමන්ගේ පාප පිළිබඳව පසුතැවිලි වීම දෙවියන්වහන්සේගෙන් කරුණාව ලැබීමට හේතුවන අතර, එය සමාව ලබා ගැනීමට පමණක් නොව, එකී පාප අතහැර ඉන් ඉවතට යෑමයි. ඇදහිලිවන්තයකු ලෙස ජීවත් වන විටත් පසුතැවිලි වීම යන කාරණය අපට ඉතාමත් අත්‍යාවශ්‍යය. කාලය ගතවෙත්ම අපි කිතුණු ජීවිතයට හුරුපුරුදු වී පුරුද්දට වාගේ සියල්ල කරයි. එවිට නැවත ආත්මික මරණය අප කරා ළඟාවන අතර අපි නාමික කිතුණුවන් බවට පත්වේ. පාපය පිළිබඳ ගැඹුරු හා බරපතල ලෙස සැලකීම අපගෙන් පහව යයි. ඒ නිසා අප ආත්මික පරිණතභාවයට පත්වීම ඇණ හිට, ආත්මික බිළිදුන් ලෙස ජීවත්වීමට පුරුදු වෙයි. මෙම තත්වය දෙවියන්වහන්සේගේ සේවයේ දියුණුවට මහත් ලෙස බලපා ඇත. එමෙන්ම මෙවැනි කිතුණුවන් තුලින් සාතන් දෙවියන්වහන්සේගේ නාමයට අගෞරවය හා නින්දාව ගෙන එයි. එ බැවින් ඔබගේ ජීවිතයේ තිබෙන පාප පිළිබඳව ඔබ බරපතල ලෙස ගැඹුරින් කල්පනා කර ඒවා දෙවියන්වහන්සේට කියා දී සමාව ලබා ගෙන ආත්මික පරිණතභාවයට ඔසවා තබන ආත්මික ව්‍යායාමවල යෙදෙන්න.

### 02 දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහීම

වරක් පාපයේ ජීවත් වූ අප යේසුස්වහන්සේගේ සුභාරංචිය අසා ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොට ගෙන දෙවියන්වහන්සේගේ දරුවන් බවට පරිවර්තනය වුනෙමු. පාපයට

සමාව ලැබීම, නිරයෙන් ගැලවීම හා සදාකාල ජීවනය ලැබීම වැනි කාරණා අප ඒත්තු ගත් නිසා නැවුම් ප්‍රීතියකින් අප පිනා ගියෙමු. නමුත් කල් ගත වෙත්ම දෙවියන්වහන්සේ කෙරෙහි හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අප තුළ ඇති ඇදහිල්ල ක්‍රමානුකූලව හීන වී ගෙන යන ස්වභාවයක් දැකීමට හැකිය. දෙවියන්වහන්සේගේ පොරොන්දු කෙරෙහි ඇදහීම අත්‍යාවශ්‍යය. විශේෂයෙන්ම පව්කමාව, නිරයෙන් ගැලවීම, මරණින් පසු දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම සහ යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම වැනි මූලික ඉගැන්වීම් පිළිගැනීම, ඇදහීම හා ඒවා තුල ජීවත් වීම තුලින් අප ආත්මිකව පරිණත භාවයට පමුණුවයි. දෙවියන්වහන්සේගේ දරුවන් වූ අපි උන්වහන්සේගේ පුත්‍රයන් බවට පත්වීමට ආශා විය යුතුය. ආබ්‍රහම් දෙවියන්වහන්සේ කෙරෙහි තිබූ ඇදහිල්ල නිසා දෙවියන්වහන්සේගේ මිත්‍රයා බවට පත්විය. (හෙබ්‍රෙව් 11:1-40)

**03. බෞතීස්මය.**

බෞතීස්මය යනු දෙවියන්වහන්සේ කෙරෙහිද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහිද අදහාගත් පසු කීකරුවීමේ පියවරකි. මෙය වතුර බෞතීස්මය ලෙස හැඳින්වේ. යේසුස්වහන්සේ අදහාගත් දිනයේම ශුද්ධාත්මයාණන්ගෙන් අප බෞතීස්ම කරනු ලැබේ. එනම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් අප තුළ වාසයට පැමිණෙන සේක. එවිටම අප උන්වහන්සේගේ මරණය තුලට බෞතීස්ම කරනු ලැබේ. (රෝම 6:6) මේ සියල්ල අප යේසුස්වහන්සේ අදහාගත් මොහොතේදීම දෙවියන්වහන්සේ අප ඇතුලාන්තයේ සිදු කරන අතර, වතුරේ ගිල්ලවීමේ බෞතීස්මය අප විසින් ගත යුතු තීරණයකි. දෙවියන්වහන්සේගේ වචනයට කීකරුවීමකි. මෙමඟින් අප යේසුස්වහන්සේ අදහාගත් බවත් මම දැන් දෙවියන්වහන්සේගේ දරුවකු බවත් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමකි. අප අවට සිටින ඇදහිලිවන්තයෝ (සභාව), ලෝකයා, යක්ෂයා හා ඔහුගේ දූත සේනාව දකියි. නමුත් ස්වර්ගයට යාම සඳහා බෞතීස්මය ලැබීම අත්‍යාවශ්‍ය නොවේ. ගැලවීම තුලින් නැවත ඉපදීම ලබා තිබෙන සියලු දෙනා මරණින් පසු ස්වර්ගයට ඇතුල් වෙයි (යොහාන් 3:3).

**04 අත් තැබීම.**

අත් තැබීම මූලික කාරණයක් ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේ අපට පෙන්වා දෙන සේක. මෙහි අර්ථය වන්නේ ඒකත්වය ප්‍රකාශ කිරීමකි. සභාවේ වැඩිමහල්ලන් විසින් යම් කෙනෙකු පිට අත් තබා යාච්ඤා කිරීමෙන් පෙන්නුම් කරනුයේ මුළු සභාවේම ඒකත්වයයි. තෝරාගත් සේවයකට පත් කිරීම පිණිස (ක්‍රියා 13:3), සුවය පිණිස (යාකොබ් 5:15-16) බෞතීස්ම ලැබීමෙන් පසු මෙසේ අත්තැබීමේ අවස්ථා දැක ගත හැක. යම් කෙනෙකුගේ අත් තැබීමෙන්

ශුද්ධාත්මය අපට ලැබෙයි යන්න බොරු ඉගැන්වීමකි. ශුද්ධාත්මයාණන් අපට ලැබෙන්නේ අපි අපේ පව් ගැන පසුතැවිලිවී යේසුස්වහන්සේගේ ක්‍රියාව විශ්වාස කර උන්වහන්සේ අදහාගත් මොහොතේදීමය.

**05 මළවුන්ගෙන් නැගිටීම.**

කිතුණු ඇදහිල්ලේ අත්තිවාරම වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීමයි. එනම්, උන්වහන්සේගේ සදාකාලික ජීවමානභාවයයි. උන්වහන්සේ කුරුසිය මත මරණයට පත් වූ බවත් තැම්පත් කරනු ලැබූ බවත් තුන් වෙනිදා මළවුන්ගෙන් නැගිටුණු බවත් අප විශ්වාස කළ යුතුය. යේසුස්වහන්සේ යනු තවත් ආගමික නායකයෙකු නොවන බවත් උන්වහන්සේ අසහාය වූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවත් අදත් උන්වහන්සේ ජීවමානව අප අතරේ අප තුළ වාසය කරන බවත් අප විශ්වාස කළ යුතුය. බයිබලයේ අලුත් ගිවිසුම පුරාවට ලියා තිබෙන උන්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම ගැන සාක්ෂි කියවා බලා, ඒ ආකාරයෙන්ම විශ්වාස කළ යුතුය. දිනපතා සෑම මොහොතකම මෙම පරම සත්‍යය අපගේ හද තුළ රැව් පිළිරැව් දිය යුතුය. උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය කෙරෙහිද අපගේ අවබෝධය හා විශ්වාසය වැඩි වෙන තරමට අප පරිණත ඇදහිලිවන්තයන් බවට පත් වෙයි. (1 කොරින්ති 12:19)

**06. සදාකාල විනිශ්චය.**

සදාකාල දෙවියන්වහන්සේගේ සදාකාල විනිශ්චය යනු මහත් විශාල වූ විෂයකි. කිසිදිනෙක කිසිවෙකුට සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීමට අපහසු වූ විෂයකි. නමුත් මේ ගැන මූලික අවබෝධය සෑම කිතුණුවෙකුටම තිබීම ඉතා වැදගත්ය. පව්කාරයාට සමාව දීමේ සිට එළිදරව් පොතෙහි සදහන් වන අවසාන විනිශ්චය දක්වාම ඇත්තේ උන්වහන්සේගේ ධර්මිෂ්ඨ හා භයානක විනිශ්චයයි. ප්‍රධාන වශයෙන් පසුතැවිලි නොවන අයට තිබෙන නිරයේ දඬුවම (ලූක් 16:19-31) සාතන්ට නියමව තිබෙන අවසාන දඬුවම (එළිදරව් 20:10) හිද, ඇදහිලිවන්තයන්ට නියමව තිබෙන ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චය (එළිදරව් 20:11-152) හිද ප්‍රධාන වශයෙන් කැපී පෙනෙයි. උන්වහන්සේ කෙරෙහි අදහන අප උන්වහන්සේගේ සැරකම පිළිබඳව ද, උන්වහන්සේගේ යහපත්කම පිළිබඳව ද, දේව වචනයානුකූල දැනගැන්මක් හා ඒවා කෙරෙහි විශ්වාසයද තිබිය යුතුය.

වත්මන් සමාජය තුල වැඩුණු. පරිණත කිතුණුවකු ලෙස ජීවත් වීමටත් ඒ ආකාරයෙන්ම සේවය කිරීමටත් ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට උපකාර කරන සේක්වා.

**- එස්. මෙත්තානන්ද -**
**සංස්කාරක**
**077 8813197**

# ශුද්ධ බයිබලයේ විද්‍යාත්මක නිවැරදිභාවය

★ විශ්වයේ ස්වභාවය - (යෝබ් 9:8)

★ පෘතුවිය අවකාශයේ එල්ලී තිබීම - (යෝබ් 26:7)

★ පෘතුවි ගර්භය තුල ඇති අධික උෂ්ණත්වය - (යෝබ් 28:5)

★ ජල චක්‍රය - (යෝබ් 36:27-28 / 37:16)

★ මුහුදේ උල්පත් - (යෝබ් 38:16)

★ උෂ්ණත්වයේ වෙනස මගින් සුළඟ නිෂ්පාදනය වීම. - (යෝබ් 28:24)

★ විශ්වයේ ආරම්භය - (උත්පත්ති 1:1)

★ ගණන් කර නිම කල නොහැකි තාරකා පංති - (යෙරමියා 33:22)

★ එක් එක් තාරකාවන්ට නියමිත ගමන් මාර්ගයක් තිබීම - (විනිශ්චයකාරයා 5:20)

★ පෘතුවියේ ගෝලීයභාවය - (යෙසායා 40:22)

★ රුධිරය පිළිබඳ නිවැරදි විග්‍රහය - (ලෙවි 17:11)

★ මුහුදේ කඳු - (යෝනා 2:6)

★ සූර්යාගේ ගමන් මාර්ගය - (ගීතාවලිය 19:4-6)

★ පෘතුවියේ කාල කලාපය - (ලූක් 17: 34-36)

# ශුද්ධ බයිබලය සත්‍ය බවට සාක්ෂි - (2 තිමෝති 3:16)

★ වසර 2000ක් පුරා නොවෙනස්ව පැවතීම.

**ඉතිහාසයේ සිටි කැපී පෙනෙන බයිබල් පරිවර්තකයන්.**

- ජෝන් වික්ලිෆ් - (1336 - 1384)
- විලියම් ටින්ඩෙල් - (1494 - 1536)

★ අත් පිටපත් කොටස් 5000ක් පමණ අදටත් දැකබලා ගැනීමට හැකි වීම. මේවා විවිධ කටුගෙවල්වල ප්‍රදර්ශනයට තබා ඇත.

★ අසාමාන්‍යය ඉල්ලුම හා අලෙවිය. ලොව පළමු මුද්‍රිත පොත බයිබලයයි. 16 වැනි ශත වර්ෂයේ සිට ලොව වැඩියෙන්ම අලෙවි වන පොත. ලොව වැඩිම භාෂා ගණනකට පරිවර්තනය වූ පොත බයිබලයයි.

★ කතෘවරුන් 40ක් පමණ වසර 1500ක් තිස්සේ විටින් විට ලියූ නමුත් බයිබලයේ තේමාව වෙනස් නොවී ඒකීයභාවයක් පැවතීම.

★ විද්‍යාත්මක නිවැරදිභාවය.

★ ඓතිහාසික නිවැරදිභාවය.

★ ඉටු වූ අනාගත වාක්‍යය.

★ විපර්යාසයට ලක් වූ ජීවිත.

# ශුද්ධ බයිබලය සමාන කර ඇති දෑ:

| | | |
|---|---|---|
| 01. දෙමුහත් කඩුව | - | හෙබ්‍රෙව් 4:12 |
| 02. ගින්දර - (ගින්නක්) | - | යෙරමියා 23:29 / ලූක් 24:32 |
| 03. කුළු ගෙඩිය (මිටිය) | - | යෙරමියා 23:29 |
| 04. කැඩපත | - | යාකොබ් 1:23 |
| 05. ජලය | - | එපීස 5:27 |
| 06. කිරි / මී පැණි | - | 1 පේත්‍රුස් 2:3 / ගීතාවලිය 119:103 |
| 07. පහන | - | ගීතාවලිය 119:105 |

# ශුද්ධ බයිබලය හඳුන්වා ඇති ආකාරය

| | | |
|---|---|---|
| 01. ජීවනයේ වචනය | - | පිලිප්පි 2:15 |
| 02. සත්‍යයේ වචනය | - | කොලොස්සි 1:5 |
| 03. ධර්මිෂ්ඨකමේ වචනය | - | හෙබ්‍රෙව් 5:13 |
| 04. අනුග්‍රහයේ වචනය | - | ක්‍රියා 20:32 |
| 05. ඇදහිල්ලේ වචනය | - | රෝම 10:8 |
| 06. බලපරාක්‍රමයේ වචනය | - | හෙබ්‍රෙව් 1:3 |
| 07. රාජ්‍යයේ වචනය | - | මතෙව් 13:19 |



# දේව වචනයට අප කල යුතුදේ

01. දිනපතා කියවීම : ද්විතිය කථාව 17: 19 - 20

02. කියවන අතර අධ්‍යයනය කිරීම : 2 තිමෝති 2:15

03. නිතර මෙනෙහි කිරීම : ගීතාවලිය 1:2 / ගීතාවලිය 119:97

04. තමාට හා සේවයට අදාල කොටස් කට පාඩම් කිරීම : ගීතාවලිය 119:11

05. කීකරුවීම (පිළිපැදීම) : යාකොබ් 1:22

06. ශුද්ධ බයිබලය යන යන තැන රැගෙන යෑම : ගීතාවලිය 149:6

07. දේව වචනය කථාකිරීම, ඉගැන්වීම, බෙදාගැනීම : ද්විතිය කථාව 6:7

# දේව වචනයේ අනේක විධ ප්‍රයෝජන

01. ආත්මික ජීවනය උපදවයි : යොහාන් 3:5/ යාකොබ් 1: 18/ 1 පේත්‍රුස් 1:23

02. ආත්මික නමස්කාරයට පොළඹවයි : හෙබ්‍රෙව් 4:12 / යොහාන් 4:24

03. ආත්මික වර්ධනය ඇති කරයි : 1 පේත්‍රුස් 2:3

04. ආත්මික හඟවාදීම (තදින් හදවතට කතාකොට ඒත්තු ගැන්වීම) :
    යෙරමියා : 23-29

05. ආත්මික විශුද්ධිකරණය : එපීස 5:26

06. ආත්මික ස්ථාවරභාවය හා මේරූභාවය ඇති කිරීම : 2 තිමෝති 3:16-17

07. ආත්මික ප්‍රඥාව සහ මඟපෙන්වීම ලබා දීම : ගීතාවලිය 119:105,130

08. ආත්මික ජීවිතය සෝදිසි කිරීම හා තත්ව පරීක්ෂණය කිරීම :
    ගීතාවලිය 105:19

09. දෙවියන්වහන්සේගේ ප්‍රසාදය අප කෙරෙහි ඇති කරයි : යොහාන් 15:7

10. සැබෑ ආශිර්වාදලත් භාවය ඇති කරවයි.

**- බයිබල් අධ්‍යයනයක් ඇසුරෙන් -**

බයිබලයේ රජවරු.

# එඩිතර එඩේර දරුවෙක්

සාවුල් රජුගේ දුක්ඛිත අවසානය සමඟම ඊශ්‍රායෙල් දේශයට අවශ්‍යය වූ රජ (ඊශ්‍රායෙල් වරුන්ගේ දෙවන රජ) වශයෙන් නිරායාසයෙන්ම දාවිත් පත්විය. එසේවූයේ සාවුල්ගේ රාජ්‍යය සමයේදී ඔහු දෙවියන්වහන්සේට අකීකරු වීම නිසා ස්වාමින්වහන්සේ ඔහු ප්‍රතික්ෂේප කළ අතරම දාවිත් නම් එඬේර තරුණයා සාමුවෙල් අනාගතවාතෘ විසින් රජකමට ආලේප කර තිබුනු නිසාය. දාවිත්ගේ ජීවිතය සත්‍යයෙන්ම ක්‍රිස්තියානිකාරයෙකුගේ ජීවිතයක සිදුවීම්වලට බෙහෙවින්ම සමානය. ඔහු සාමාන්‍යය වැසියෙකු වූ යෙස්සේගේ පුත්‍රයෙකි. උගත්කමත් කීර්තියත් සොයා යන්නන්ට දාවිත් කදිම ආදර්ශයකි. ඔහු නිකම්ම නිකම් එඬේර තරුණයෙකි. ඔහු බෙත්ලෙහෙම් නුවර යුදා ගෝත්‍රික වැසියෙකි. 1 සාමුවෙල් 6 වැනි පර්ච්ඡේදය කියවීමෙන් ඔබට දාවිත්ගේ රජකම පිළිබඳ මූලික තොරතුරු රැස්කර ගත හැකිවනු ඇත. එලියාබ්, අබිනාදම්, ෂම්මා, ඇතුළු සහෝදරයන් රැසකගෙ න් යුත් පවුලක බාලයා වූ දාවිත් තමාගේ වැඩිමහල් සහෝදරයන් මෙන් දක්ෂ යුද්ධ කාරයෙක්ද නොවීය. දාවිත් පවුලේ අටවෙනි දරුවා බව 1 සාමුවෙල් 16: 10 හා 11 පදවල පෙන්වාදෙයි. 1 සාමුවෙල් 17 : 12 ද බලන්න.

**දක්ෂ නායකයා.**

සාමුවෙල් තෙල් කුලාව ගෙන යෙස්සේගේ ගෙදරට ගොස් ඔහුගේ පුතුන් හත් දෙනෙකු පරීක්ෂාවට භාජනය කළේය. එහෙත් ස්වාමීන්වහන්සේගේ තේරීම එහි නොවීය. අටවැන්නා බැටළුගාලේ සිට කැඳවන ලදී. ඔහු දේව කැමැත්තට රුචි වූ දාවිත් විය. රතු පාට ශෝභමාන පෙනුමකින් හෙබි දාවිත් තරුණයෙක්ව සිටියේය. ( 1 සාමුවෙල් 16:12) ඔහුගේ සහෝදරයන් මැදදී දාවිත් ආලේපය ලැබීමත් සමඟම දේවාත්මයෙන් පූර්ණ ආනුභාවය ඔහුට ලැබිණි. ඔහු ගීත ගායනයෙන් ඉතා දක්ෂයෙක් වූයේය. පසුව ඔහු දක්ෂ යුද්ධකාරයෙක් හා වික්‍රමාන්විත පෙනුමකින්ද, කථා චාතුර්යෙහිද කීර්තිමත් විය. එසේ වූයේ ඔහු ආලේප ලැබීමෙන් පසුවය. මෙහිදී 1 යොහාන් 2:20 මතකයට නැගීම යෝග්‍යය. ගැලවීමේ නිසි අත්දැකීමෙන් නැවත උත්පාදිත සෑම ඇදහිලිවන්තයෙකුටම මෙම දේව ආලේපයද (ශුද්ධාත්මය) තිබේ. “ඔබලා ශුද්ධ තැනැන්වහන්සේගෙ න් ආලේපයක් ලැබ, සියළු

දේම දන්නහුය" යි යොහාන් ඇදහිලිවතුන්ට ලියා තිබේ. මිනිස් මත බැහැර කල දේවදාසයා වූ යොහාන්ගේ පණිවුඩය පිළිගැනීම කාලෝචිතය.

**වීණා වාදනයක්.**

මේ කාලයේදීම සාවුල් රජුට නපුරු ආත්මයක් වරින් වර ආවේශ විය. එයින් ඔහු බලවත් පීඩනයකට පත් විය. දක්ෂ වීණා වාදකයෙකු ලවා වීණාවාදනය කිරීමෙන් මෙම අශුද්ධාත්ම බලය පලවා හරිනු ලැබීම අවශ්‍ය වුයෙන් ඒ සඳහා රජ මැදුරට කැඳවන ලද්දේ දාවිත්වය. මේ අතර පිලිස්තිවරු නිබඳවම ඊශ්‍රායෙල්වරුන්ට විරුද්ධව සටන් වැදුනහ. සාවුල්ද ඔවුන් හා සටනට වන් නමුදු ඔහුට බලවත්ම අභියෝගය වුයේ එපෙස්දම්මීම් නම් ස්ථානයෙහි කඳවුරෙන් නික්ම ආ



හැඩිදැඩි පිලිස්ති යෝධයාය. ඔහු ගොලියත්ය. 1 සාමුවෙල් 17 කියවන විට මෙම පිලිස්තිය යෝධයා පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය වේ. ඔහු හය රියන් හය හමාරක් උස වූ සිය හිසෙහි පිත්තල තොප්පියක් පැළඳ ලෝහ සැට්ටයකින් ළය වසා සිටියේය. දිනපතාම සිය කූටියෙන් පිටතට බට මේ යෝධයා මිටියාවතේ එහා ඉවුරෙහි කඳවුරු ලා සිටි ඊශ්‍රායෙලිතියන්ට විරුද්ධව දොස් තබමින් අවලාද නැගුවේය. ඔහු මොරගසා "මා ළඟට එන පිණිස නුඹලා අතරෙන් මනුෂ්‍යයෙකු තොරා ගනිල්ලා. මා මරන්ට ඔහුට පුළුවන් වුනොත් අපි නුඹලාට මෙහෙකරුවන් වෙමු. මා ඔහුගෙන් ජයගෙන ඔහු මැරුවොත් නුඹලා අපේ මෙහෙකරුවන්ව අපට සේවය කළ යුතුයි." ( 1 සාමුවෙල් 17:8-9) කීවේය. මෙම අභියෝගයට මුහුණ දිය නොහැකිව මුලු ගැන්වුණ සාවුල්ගේ සේනාංකයෙහි දාවිත්ගේ වැඩිමහල් සොහොයුරන් තිදෙනාත් සිටියහ. යෝධයාද 40 දවසක් පුරා තම අභියෝගය එල්ල කරමින් මොර ගැසුවේය.

**රාජ්‍ය සම්පත්.**

යෙස්සේගේ බැටළුවන් පසු පස දුව පනිමින් සිටි ආලේපලත් දාවිත් තම සොහොයුරන්ට ආහාර

ගෙන කඳවුරට ගිය දිනෙක යොධයාගේ කට මැත දෙඩවීම ඔහුට ඇසුණි. දාවිත්ට එය රුචි නොවීය. ඊශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමින්වහන්සේට විරුද්ධව අභියෝග කරන ගොලියත්ට විරුද්ධව ඔහු යුද කඳවුරේදී අදහස් දැක්විය. මේ ඇසූ ඔහුගේ සහෝදරයෝ කිපී දාවිත් පන්නා දැමීමට සැරසුනහ. එහෙත් තරුණ දාවිත් අධෛර්යට පත් නොවීය. 1 සාමුවෙල් 17:25 අනුව ගොලියත් මරා දැමීමට සමත් ඕනෑම අයෙකුට ලැබෙන ත්‍යාග පිළිබඳ සාවුල් රජ විසින් ප්‍රකාශනයක් නිකුත් කර තිබුණි. රජතුමන් විසින් ගොලියත් මරණ මනුෂ්‍යයාට බොහෝ වස්තුවත් සමඟ තම දියණියත් සරණ පාවා දී ඊශ්‍රායෙල් දේශයේ උසස් පිය වංශයට ඔහු උසස් කරණු ඇතැයි සඳහන් එම ප්‍රකාශනය දාවිත් උතුම් ලෙස නොසැලකූ නමුත් තම දෙවියන්වහන්සේගේ නාමය දරණ ජාතිය මුහුණපා ඇති තත්වය පිළිබඳව දැඩි සංවේගයක් මුසු පිබිදීමක් ඔහු තුල ජනිත විය. දාවිත් එඬේරකම් කරන අතර බැටළුවන් කොල්ලකෑමට ආ සිංහයෙකු හා වළසෙකු දාවිත් විසින් දක්ෂ ලෙස මරා දමනු ලැබුවේය. ඔහු සාවුල් රජ හමු වී තමා ගොලියත්ට විරුද්ධව පෙර මඟට යාමට සූදානම් බව කියා



පෑවේ ඉහත හපන්කමද දක්වමිනි. එහෙත් රණශූරයන්ට අභියොගයක් වූ ගොලියත් පරදවන්නට දාවිත් වැනි සුකුමාල තරුණයෙකුට හැකිවන්නේ කෙසේදැයි සාවුල් කල්පනා කලේය. ඔහු දාවිත්ට අවස්ථාවක් දෙන්නට නොසතුටු විය. මීළඟ කලාපයේද අප සාකච්ඡා කරනුයේ දාවිත් ගැනමය.

**- ප්‍රන්සිස් විජයසිංහ -**

# ප්‍රායෝගික කිතුණු ජීවිතය

**සුවසේ සිටපල්ලා, සම්පූර්ණ වෙයල්ලා, සැනසී සිටපල්ලා, එක්සිත් වෙයල්ලා, සමාදානයෙන් සිටපල්ලා, එකල ප්‍රේමයේ හා සමාදානයේ දෙවියන්වහන්සේ නුඹලා සමඟ වසන සේක. (2 කොරින්ති 13:11)**

ඉහත බයිබල් පදය පාවුල්තුමා කොරින්ති සභාවට කරන අවසන් සුභාෂිංශනයයි. ඔහුගේ මෙම සුභාෂිංශනය සභාවට යොමු කිරීමට පාවිච්චි කරන වචන දෙස බැලීමේදී ඔහු එය අවංක සිතෙන් මෙන්ම පිය සෙනෙහසකින් කල බව පෙනේ. මුළු හදවතින් කරන මෙම ප්‍රාර්ථනාව තුලින් සභාව හා ඇදහිලිවන්තයන්ගේ සහභාගී කම පිළිබඳ ඔහුගේ සිතේ තිබුණ සැබෑ ආශාව පැහැදිලි කරයි.

## සුවසේ සිටපල්ලා

ආයුබෝවන්, සමුගැනීමේ සටහන තේරුම් ගත හැකි අන්තර්ගතයක් සහිතයි. ඔහු කියූ සියල්ල පිළිපැදීමට හැකි වන ලෙසද, ඒ අනුව ජීවත්වීමට ධෛර්යය ලැබෙන ලෙසද ඒ ආකාරයෙන් හොඳ ජීවිතයක් ගත කරන ලෙසද ඔහු සුභ ප්‍රාර්ථනා කරයි. සුවසේ සිටපල්ලා යන්නෙහි අර්ථය හොඳ ජීවිතයක් ගත කරපල්ලා යැයි කිව හැක. ඇදහිලිවන්තයා ආත්මිකව සඵල වීම ස්වාමීන්වහන්සේගේ ආශාවයි. එමෙන්ම ඔහු මෙලොව ජීවිතයද සාර්ථක ජීවිතයක් විය යුතුය. ශාරීරිකව මෙන්ම මානසිකවද හොඳාකාරවම දියුණු වී සෞභාග්‍යමත් ජීවිතයක් ගත කිරීම පාපයක් නොවේ. ඒ බැවින් වර්තමාන ඇදහිලිවන්තයා ආත්මික මෙන්ම භෞතික වශයෙන්ද දියුණු වීම වැදගත්ය. ඒ මගින් ස්වාමීන්වහන්සේගේ නාමයට වඩා ගෞරව පැමිණෙනවා ඇත. භෞතික වශයෙන් දියුණු වීමේදී ඉතාම ධර්මිෂ්ඨ මාර්ග තෝරා ගත යුතුය. වංචාව, බොරුව, පගාව, අල්ලස්, හොර මැරකම්, දේශපාලන බලය, වැනි අයතා කම් යොදා ගැනීමෙන් ඇදහිලිවන්තයා තමාගේ භෞතික දියුණුව සලසා ගැනීම මහත් පාපයකි. නුමුත් මහන්සි වී ධර්මිෂ්ඨ වූ මාර්ගයෙන් දියුණු වීම දෙවියන්වහන්සේට මහත් ගෞරවයකි. එවැනි අයට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක. ඒ බැවින් සෑම ඇදහිලිවන්තයෙක්ම හොඳ යහපත් ජීවිතයක් ගත කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්තය. ඇදහිලිවන්තයන් බියගුලු, සිඟාකන අය නොවිය යුතුය. ඔවුන් වංචාකාරයන්ද නොවිය යුතුය.

## සම්පූර්ණ වෙයල්ලා

ඇදහිලිවන්තයාට සම්පූර්ණභාවය පැමිණෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීම මගිනි. පව්කමාව ලැබීම සම්පූර්ණත්වයට පැමිණීමේ ආරම්භයයි. ඉන් ඉදිරියට ඇදහිලිවන්තයා දෙවියන්වහන්සේ සිතන පතන හා ක්‍රියා කරන ආකාරයට තම ජීවිතය ඉදිරියට ගෙන යාමට උත්සහ කරයි. තම ජීවිතයේ ක්‍රියා කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට ඉඩ දීම මගින් ඇදහිලිවන්තයාට තම ජීවිතය

සම්පූර්ණත්වය ළඟා කර ගත හැක.

**සැනසී සිටපල්ලා**

අප අවට තරඟකාරීභාවය හා කලබලකාරීභාවයෙන් පිරී පවතී. එහෙත් යේසුස්වහන්සේ අදහන්නාවූ අය මෙම සමාජීය තත්වයන්ට මුහුණ දීම කෙසේ කළ යුතුද? ඇදහිලිවන්තයා මේ ලෝකයට අයිති නොවන බව බයිබලය පවසයි. "පවතින නුවරක් මෙහි අපට නැත. අප විසින් සොයන්නේ මතු පැමිණෙන නුවරය" (හේබ්‍රෙව් 13:14). සැනසිල්ල ලැබෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ගෙනෙන ලියවිලි වලින් බව අපි දනිමු. සැනසිල්ලෙන් ජීවත් වීමට නම් අප දේව වචනය කියවිය යුතුය. එය ඉගෙන ගත යුතුය. එයට කීකරු විය යුතුය. සැක නොකොට බයිබලය විශ්වාස කළ යුතුය. එවිට කිසි නුවණකින් දැන ගත නොහැකි දෙවියන්වහන්සේගේ සමාදානය අප කෙරෙහි රජකම් කරනවා ඇත.

**එක්සිත් වෙයල්ලා**

දෙවියන්වහන්සේගේ දරුවන් එක්සිත්ව ජීවත්වීම දෙවියන්වහන්සේගේ හදවත ප්‍රීතිමත් කරවන ව්‍යායාමයකි. නමුත් එක් කාරණයක් සඳහාම කෙනෙකුගේ එක්සිත්භාවය ඇති කර ගැනීම මහත් අමාරු කාරණයකි. නමුත් එක්සිත් වීමට නොහැකි නම් එයට ඉඩදීම හොඳ ගුණාංගයකි. එබැවින් එක් සිත් වීමට නොහැකි නම් බාධා නොකර ඉඩදීම තුලින් අපට දෙවියන්වහන්සේගේ පාලනයට එම කාරණය භාර දිය හැකිය. නමුත් බාධා කර රණ්ඩු කිරීම නොකල යුතුය. මුළු බයිබලය පුරාවටම එක්සිත්භාවය අගයයි.

**සමාදානයෙන් සිටපල්ලා.**

"නුඹලාගෙන් විය හැකි ප්‍රමාණයට, සියලු මනුෂ්‍යයන් සමඟ සමාදානයෙන් සිටින්න" (රෝම 12:18). ස්වභාවයෙන්ම අප තරහ මරහ වීමට හපන්නුය. නමුත් අප ගැලවීම ලැබූ පසු පරණ පාපකාරී ස්වභාවය වෙනුවට ක්‍රිස්තු ස්වභාවය අප තුල ශුද්ධාත්මයාණන් විසින් ජනිත කරන සේක. ක්‍රිස්තුස්වහන්සේ කිසිවකු සමඟ අමනාපවී සිටියේ නැත. උන්වහන්සේට ඇණ ගැසූ අයට පවා සමාව දී සමාදානය ඇතිව සිටි සේක. එබැවින් අපත් සෑම කෙනෙකු සමඟම හැකි පමණ සමාදානයෙන් සිටීම දෙවියන්වහන්සේගේ කැමැත්තයි. අප කිසිවෙකු සමඟ අමනාප නොවෙමු. අවංකව සමාව දී එකිනෙකාට යහපත කරමු. කමාවේ පණිවිඩය වන සුභාරංචිය බෙදා හරිමු. මේ ලෝකයට අවශ්‍යය නියම සමාදානය පැමිණෙන්නේ සුභාරංචිය කරණකොටගෙන පමණක් බව අප දැන ගනිමු.

අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන්නේනම් අපගේ ඇදහිල්ල ප්‍රායෝගිකව දිනපතා ජීවිතයේ කටයුතු වලදී පෙන්නුම් කිරීමට අප උත්සාහ කරමු.

**- ගුරුහරු -**

# ඉටි පන්දම

දවසක් රාත්‍රියේ සභාවේ රැස්වීමක් පැවැත්වෙමින් තිබෙන අතරේදී හදිසියේ විදුලිය විසන්ධි වුණා. මුළු ශාලාවම අන්ධකාර වුණා. එක සහෝදරයෙක් ඉක්මණට නැගිට ගොස් ඉටි පන්දමක් දැල්වූවා. ඊට පසුව තවත් ඉටිපන්දම් ගොඩක් ගෙනාවා. දැන් ශාලාව ටිකක් එළියයි. පසුව ගෙනා ඒවාද එකිනෙක දල්වා ශාලාවේ තැනින් තැන තැබුවා. දැන් හොඳට එළියයි. විදුලි පහන්වල පවා එළිය මනින්න මේ පුංචි ඉටිපන්දම් උපයෝගී වෙනවනේ කියලා මට මතක් වුණා. මේ පුංචි සිද්ධියෙන් ඇදහිලිවන්තයන් වන අපට ඉගෙන ගන්න ලොකු පාඩමක් තියෙනවා.

එක එක ඉටිපන්දමෙන් එක එක ඇදහිලිවන්තයකු අපි උපමාවට ගනිමු. දැල්වෙන්නේ නැතිනම් ඉටිපන්දමෙන් ප්‍රයෝජනයක් නෑ. ආලෝකයෙන් උපමා කරන්නේ යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ගුණාංගයි. මුල්ම ඉටිපන්දම දැල්වුණා වාගේ එක් කෙනෙක් යේසුස්වහන්සේව පිළිගත්තාම ඔහු තුළ යේසුස්වහන්සේ සිටින නිසා උන්වහන්සේගේ ගුණාංග කියන එළිය විහිදෙනවා. මෙයින් නවතින්නේ නෑ. ශාලාව අඳුරු වුණාම එක එළියක් දල්වලා නවතින්නේ නැතුව එම ඉටි පහනේ එළිය තව එවැනිම පහන් ගොඩකට බෙදිලා ගියා. අන්න ඒ වගේ ඇදහිලිවන්තයන් තුළින් යේසුස්වහන්සේගේ ජීවිතයේ තිබුණ ගුණාංග, ඒ කියන්නේ එතුමා තුළ තිබුණ ප්‍රේමය, ඉවසීම, සමාවදීමේ ගතිය, මෘදු ගතිය, කරුණාව වගේ දේවල් අනිත් ඇදහිලිවන්තයන්ටත් බෙදිල යන්න ඕනෑ. එවිට ඒ අයටත් යේසුස්වහන්සේව අදහාගෙන පුංචි ආලෝකවල් වෙලා තවත් අයට එළිය දෙන්න පුළුවන්.

අන් අයට යේසුස්වහන්සේ ගැන කියාදීමත්, පත්‍රිකා ආදිය බෙදා දීමත් ඉතාම හොඳ ගුණාංගයකි.

ඉටිපහන් දැල්වුවත් අපි හොඳින්ම දන්නවා නැවත විදුලි එළිය පැමිණෙන බව. එලෙසින්ම අද ශරීරාකාරව යේසුස්වහන්සේ ස්වර්ග රාජ්‍යයෙහි සිටියත් ඉක්මණින්ම උන්වහන්සේ යළි පැමිණෙන බවත් අමතක කරන්න එපා. විදුලිය යළි ආවම අපට ඉටි පහන් අවශ්‍ය නෑ. යේසුස්වහන්සේ ආවම තවදුරටත් අපගේ ආලෝකයෙන් පොළොවට වැඩක් නැහැ. උන්වහන්සේ අපවත් අරගෙන ස්වර්ගයට යන්න නියමිතයි. හැබැයි යේසුස්වහන්සේව අදහාගෙන සිටියේ නැත්තම් යන්න වෙන්නේ ස්වර්ගයට නෙවෙයි නිරයටයි. ඒ නිසා අදම යේසුස්වහන්සේගේ දරුවෙක් වෙලා උන්වහන්සේට කීකරුව ජීවත් වෙන්න සිතට ගන්න.

**- මිකායෙල් -**

# සැනසීම

කළුතර මතුගම ප්‍රදේශයේ පවුලේ එකම දරුවා ලෙස උපත ලැබූ මා මූලික අධ්‍යාපනය සඳහා ගමේ ප්‍රාථමික පාසලට ඇතුලත් කෙරිණි. ගමේ බොහෝ දෙනෙකුට උරුම වුන දිළිඳුකම මගේ පවුලටත් උරුම විය. නමුත් ඒ බොහෝ දරුවන් සිටින පවුල් වලටත් වඩා වැඩිපුර දැනුනේ මගේ පියාගේ බීමත්කම නිසයි. මේ නිසා මගේ මවට බොහෝ දුක් ගැහැට වලට මුහුණ දෙන්නට වූ අතර, පවුලේ බරද අෑ දරාගත්තේ පියාගේ වගකීම් රහිත ජීවිතය නිසයි. පවුලේ දුක් කම්කටොළු, කරදර බාධා උග්‍ර වූ තැන මා දරුකමට හදාග ැනීම සඳහා පොහොසත් පවුලකින් වූ ඉල්ලීම මගේ මව පිළිගත්තේ මට යහපත් ජීවිතයක් හිමිවනු දැකීමට ඇය ආශාකල නිසාය.

මා මවගෙන් වෙන් කර, තාප්පවලින්, පිටත ලෝකයෙන් වෙන් වුණ නිවසකට ගෙන යනු ලැබිණි. නමුත්, ඒ කිසිසේත්ම දරුකමට නොවන බව එහි තනිවූ මම තේරුම්ගත්තෙමි. මවගේ මතකයන් මා හදවතෙහි මැවී පෙනුනත් ඇය ළඟට මා ගෙනයන්නට එවකට මගේ විශ්වාසයන්ට හා ඇදහිල්ලට නුපුළුවන් විය. කාලය ගෙවී යන්නට විය. තරුණියක් ලෙස එක් දිනක් එම නිවසින් නිදහස ලැබුවෙමි. ලෝකය ගැන බොහෝ කරුණු කාරණා නොදත් මම ජීවනෝපය ලෙස ඇඟළුම් ආයතනයක රැකියාවට බැඳුනෙමි. කුඩා කළ සිටම ආදරය, සෙනෙහස, හරිහැටි ලබන්නට වරම් නොලත් මා එම ඇඟළුම් ආයතනයේම තරුණයෙක් හා පෙමින් බැඳුණෝ මෙතෙක් කල් මා විඳි කර්කශ ජීවිතයෙන් මිදී ඔහු සමඟ වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමේ අහිංසක බලාපොරොත්තුව සමඟය. සිනහවෙන් හෝ කතාවෙන් මිනිසා මනින්නට බැරිය. මට වූයේ කබලෙන් ලිපට වැටීමකි. බොහෝ ආදරයෙන් සිටි ඔහුගේ සැබෑ ස්වරූපය විවාහයෙන් පසුව හෙළිවිය. මගේ මව, මගේ පියා සමඟ ගෙවූ ඒ කාලකණ්ණි ජීවිතය, එසේම හා ඊට වැඩියෙන් මටත් උරුම විය.



සැනසීම සොයා ගැනීම කාන්තාරයේ දිය බිඳක් සෙවීමක් යැයි තේරුම් ගත් මා හිත හදා ගෙන දරුවන් හතර දෙනා වෙනුවෙන් ජීවත් වන්නට තීරණය කළෙමි.

සැමියාගේ බීමත්කම, රණ්ඩුදබර නිසා අපි එවකට ජීවත් වූ ඔහුගේ ඥාතීන්ගේ ගෙවල් වලින් පන්නා දමනු ලැබුවෙමු. ඉන්පසු බොහෝ කුලී ගෙවල් වල ජීවත්වුවත් ඒ සෑම ගෙයකින්ම අප පන්නා දමනු ලැබුවේ මගේ සැමියාගේ මේ ක්‍රියා කලාපය නිසයි. තවදුරටත් කුලී ගෙවල් සෙවීමෙන්වත් ඒ සඳහා මුදල් සෙවීමෙන්වත් ඵලක් නොවන බව පසක් කර ගත් මා පාර අයිනේ ලොකු ගසක් යට පැලක් අටවා ගත්තෙමි. දරුවන් සතර දෙනා පාසල් යවමින්, මාර්ග පිරිසිදු කරන්නියක් ලෙස රැකියාව කරමින්, දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්නට මා බොහෝ වෙහෙසුනෙමි. මේ පැල්පත ළගට ආ විවිධ කිතුණු නිකායන්ට අයත් බොහෝ පිරිස් මා ඔවුන්ගේ සභාවට කැඳවුයේ ජීවත් වීමට සහනයක් ලබාදීම සඳහායි. නමුත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන දැන ගැනීම හෝ කියා දීමට වඩා මගේ දිළිඳු ජීවිතයෙන් මිදීමේ බලාපොරොත්තුව මටත්, සමාජ සේවය සාර්ථක කරගැනීමේ බලාපොරොත්තුව ඔවුන්ටත් වූ බව මට පසුව පැහැදිළි විය.

මේ කාලයේදී මා ජීවත් වූ ආකාරය ගැන පුවත්පතක ලිපියක් පලවී තිබුණි. ඒ පිළිබඳව දැනුවත්වූ එවකට සිටි නිවාස සංවර්ධන අමාත්‍ය තුමන් ඒ වනවිටත් ආරම්භකර තිබූ නිවාස යෝජනා ක්‍රමයකින් මටත් කුඩා නිවසක් ලබාදීමට කටයුතු සූදානම් කර දුන්නේය. එම නිවසට යාමට ඒමට මා භාවිතා කළ විවේකානන්ද පාරේ තිබූ දේවස්ථානයක් හා එහි නිතර ගැවසෙන මිනිසුන් මා නෙත ගැටී තිබුණි. නමුත් එහි යෑමේ වුවමනාවක් මට නොවීය. එක් ඉරිදා දිනයක සවස දේවස්ථානය අසලින් ගමන් කළ මට ඒ තුළට යෑමට තද පෙළඹවීමක් විය. මා දේවස්ථානය තුළට යන විට සිංහල භාෂාවෙන් එක් සහෝදරයෙක් දේශණාවක් පැවැත්වූ අතර කිහිප දෙනෙකු එයට සවන් දී සිටින බව දුටු මා පසු පස පේළියේ පුටුවක වාඩි වුණෙමි. දේශණාවේ වැඩි කොටස මට නොතේරුණ අතර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් ලැබෙන පව්කමාව සහ සැනසීම ගැන මගේ සිතේ ගැඹුරේ සටහන් විය. පසුව මගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුද්ධ වූ ලේවලින් පව්කමාව ලැබෙන බව විශ්වාස කර, මගේ පව්කාර ස්වභාවය උන්වහන්සේ ඉදිරියේ පාපොච්චාරණය කර, මාගේ ජීවිතයේ ස්වාමියාණන් ලෙස මාගේ හදවතට උන්වහන්සේව පිළිගත්තෙමි.

ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්

වහන්සේ අදහා ගැනීම තුළින් එකවිටම මගේ ප්‍රශ්ණ කරදර නැතිවී ගොස් මා ධනවතෙක් වූයේ නැත. නමුත් මෙතෙක් කලකිරීමෙන්, සැනසීමක් නැතිව, දුක් කරදරවලින් මිරිකෙමින් සිටි මා කිසිදිනක අත් නොවිඳි හදවතේ සමාදානයත්, ප්‍රීතියත් මහා සැනසීමකුත් අත්දැක්කෙමි. සුපුරුදු කරදර, කම්කටොළු හමුවේ රැකියාව කරමින් දරුවන් සමඟ ජීවත්වන්නට වූයේ මේ සියලු අභියෝග ජයගන්නට හා ඒ තුලින් ධෛර්යයෙන් ගමන් කරන්නට මා සමඟ සැනසිලිකාරයාණන් සිටින බව අත්දකිමිනි. බයිබලයක් ලබාගෙන එය ක්‍රමානුකූලව කියවන්නට පටන්ගත් මා දරුවන් සමග ඇදහිලිවන්ත සහභාගී කමද ආරම්භ කළෙමි. කාලය ගෙවී යනවිට ප්‍රශ්ණ කරදර අඩුවන්නට විය. දරුවන්ද උස්මහත් වී රැකියාවන් ලබා විවාහපත් විය. දැන් මගේ සැමියා මිය ගොස්ය. බොහෝ විට මා නිවසේ තනිවම ජීවත් වන්නෙමි. නමුත් මා සමඟ තිබෙන සැනසීම මහත්ය. එසේම වෙනස්ය. මම දෙවියන්වහන්සේට නමස්කාරකරන්නියක්ව සිටිමි. එයට වඩා උතුම් වූ යමක් මාගේ ජීවිතයේ මා ලබා නැත.

අප මොන තත්වයේ සිටියත්, මොන ආකාර ප්‍රශ්ණ තුලින් ගියත් උන්වහන්සේ වෙතට පැමිණෙන ලෙස උන්වහන්සේ අපට ආරාධනා කරන සේක. අපි මොන විදිහේ පව්කාරයෙක් වුනත් ප්‍රේමණීය දෙවිපියාණන්වහන්සේ අපට සමාවදී, උන්වහන්සේගේ දරුවෙක් ලෙස ඔබ පිළිගන්නට සුදානම්ව සිටින සේක. මෙය මාගේ පුද්ගලික අත්දැකීමයි.

**"එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය; පරණ දේ පහව ගියේය. මෙන්න, සියල්ල අලුත් වී තිබේ."** (2 කොරින්ති 5:17)

මෙම දේවවචන කොටස සැබවින්ම මාගේ ජීවිතයේ ඉටුවිය. මා මෙන්, ලෝකයේ කරදර, ප්‍රශ්ණ, දුක්කම්කටොළු ඉදිරියේ කනස්සලු නොවී ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගැනීමේ ප්‍රීතිය හා සැනසීම අත් දැකීම සඳහා උන්වහන්සේගේ බහුල අනුග්‍රහය ඔබලා සමඟ වේවා.

**- අනුලාවතී -**
**වැල්ලවත්ත**

# ශ්‍රේෂ්ඨ අනුගමනය - 2

පසුගිය කලාපයෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීම සහ උන්වහන්සේට අපගේ ජීවිතයේ පාලනය භාර දීමට උන්වහන්සේ නිවැරදිම සහ සම්පූර්ණම තැනැත්තා බව සාකච්ඡා විය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහා ගැනීමෙන් ජීවිතයේ සිදුවන අලුත් විපර්යාසය ගැන සොයා බලමු.

ප්‍රිය සහෝදර සහෝදරිය, යේසුස්වහන්සේ අදහාගැනීමෙන් අප අලුත් මැවිල්ලක් වන බව ශුද්ධ වූ බයිබලය පවසනවා **"එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය; පරණ දේ පහව ගියේය. මෙන්න, සියල්ල අලුත් වී තිබේ."** (2 කොරෙන්ති 5:17). මෙලෙස පරණ දේ පහව ගොස් ලැබෙන අලුත් දේවල් මොනවාද?

**01. අලුත් ඉපදීම.**

අලුත් ජීවිතයක් ලබා ගන්නා අපගේ ජීවිතවලට ලැබෙන පළමුවන අලුත් දෙය නම් අලුත් ඉපදීමයි. අලුත් ඉපදීම යනු කුමක්ද? යොහාන් 3:3 **"යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්නට නොහැකිය."** මෙය ඉතා සෘජු ප්‍රකාශයකි. කොහොමද අලුතින් ඉපදෙන්නේ? යොහාන් 3:5 " **යමෙක් වතුරෙන්ද, ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්නට බැරිය."** (එනම්, දෙවියන්වහන්සේගේ ආත්මයෙන් හා වචනයෙන් ඉපදීම) මෙය ඉතා ගැඹුරු කාරණයකි. යේසුස්වහන්සේගේ කුරුසියේ ඇණගැසීම විශ්වාසකරන අය අලුතින් ඉපදීම ලබන්නෝය. මෙය සරල විශ්වාස වූ කාරණයකි.

**02. අලුත් ජීවිතය**

අලුතින් ඉපදීමෙන් පසු ලබන අලුත් ජීවිතය මොන ආකාර විය යුතුද? පරණ ජීවිතයේ ක්‍රියාවන් **"ඉදින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම්, වෛශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූපවැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදීකම්, භේද, ලබ්ධි භේද, වෛර, බීමත්කම, මංගල්‍යය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ උරුමය නොලැබෙන්නේය."** ගලාති 5:19-21 අහකදමා අලුත් ජීවිතයේ ආකාරය වන " **ආත්මයාණන්වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම,**

**යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය..."** ගලාති 5:22 ආත්මයාණන්ගේ ඵල වැළඳ ගනිමු. එය අලුත් ජීවිතයේ ආකාරයයි.

### 03. අලුත් හදවත

අලුත් ජීවිතයක් හිමිවන්නාට අලුත් හදවතක් ලැබේ. අලුත් හදවතේ තත්වය මේ ආකාර විය යුතුය. එනම් තමා පිළිබඳව ඉහළ තක්සේරුවක් නොමැති තමාගේ පාපකාරී තත්වය (තමා ගැන හරි තක්සේරුව) දැනගෙන සිටීමයි. සැබවින් තමාගේ හොඳකම නිසා නොව දෙවියන්වහන්සේගේ කරුණාව පමණක් බව පිළිගන්නා හදවත නිහතමානී සිතකි. **"සිතින් දිළින්දෝ ආශිර්වාද ලද්දෝය. මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේ ය."** (මතෙව් 5:3)

### 04. අලුත් ඇදහිල්ල.

අලුත් හදවත හිමි තැනැත්තා බයිබලයේ තිබෙන නිත්‍යයතාවයන් එලෙසින්ම විශ්වාස කරයි. නමුත් ඔහුගේ පෙර තත්වය නම් හැම දෙනාම කියන දේවල් විශ්වාස කිරීමට පෙළඹීමයි. නමුත් ශුද්ධ වූ බයිබලයේ සඳහන් පරම සත්‍යය විශ්වාසකිරීම අලුත් ඇදහිල්ලයි. **"යමෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළදරුවකු මෙන් පිළිනොගත්තොත් ඔහු කිසිසේත්ම එහි ඇතුලු නොවන්නේය."** (මාර්ක් 10:15) ළදරුවන් යමක් පිළිගන්නේ මුළු හදවතින්මය. එහි කිසිදු සැකයක් නැත. ඇත්තේ තමන් පිළිගත්දේ ඉටුවේය යන බලාපොරොත්තුවය.

### 05. අලුත් ව්‍යවස්ථාව

අලුත් ඇදහිල්ලක්, විශ්වාසයක් ලැබූ අප අලුත් ව්‍යවස්ථාවකට යටත්ය. **"එබැවින් මේ ආඥාවලින් ඉතා සුළු එකක්වත් කඩකරන්නාවූ, කඩ කරන ලෙස මනුෂ්‍යයන්ට උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා සුළු යයි කියනු ලබන්නේය. නමුත් ඒවා පවත්වන්නාවූ, උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ගරාජ්‍යයෙහි උතුම්යයි කියනු ලබන්නේය."** (මතෙව් 5:19) දෙවියන්වහන්සේගේ වචනයට අපට තිබෙන නැඹුරුව, ආශාව සහ විශ්වාසය මෙන්ම ජීවිතය දිහා බලන දෘෂ්ඨි කෝණයද දෙවියන්වහන්සේ කැමති ආකාර ලෙස වෙනස්විය යුතුය. **"මක්නිසාද මේ වර්තමාන කාලයේ දුක් වනාහී අප කෙරෙහි එළිදරව් කරනු ලබන්නාවූ මහිමයට සමාන කරනු ලබන්ට නොවටී යයි සිතමි."** (රෝම 8:18)



**06. අලුත් ප්‍රේමය**

අලුත් ව්‍යවස්ථාවකට යටත් වූ අප අලුත් ප්‍රේමයක් ලැබුවෙමු. **දෙවියන්වහන්සේ අපට ප්‍රේම කොට ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක.** (යොහාන් 3:16) **යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසියේ මරණය දක්වා කීකරු වෙමින් ඔබගෙත්, මගෙත් පාපය උදෙසා ජීවිතය දුන් සේක. දෙවියන්වහන්සේ තමන් ප්‍රේමකරනවුන්ට, "..... ඇදහිල්ලේ ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට ප්‍රේමකරනවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරා නොගත් සේක්ද? "** (යාකොබ් 2: 5) **"දෙවියන්වහන්සේ විසින් තමන්ට ප්‍රේම කරන්නන්ට සූදානම් කල යම් දෙයක් ඇද්ද, ඒ දේ ඇසට නොපෙනුණේය. කනට නොඇසුණේය, මනුෂ්‍යයාගේ සිතට නොපැමිණ්ණේය."** (1කොරෙන්ති 2:9) **"පරීක්ෂාව ඉවසන මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු ඒත්තු ගනු ලැබූ කල තමන්ට ප්‍රේමකරනවුන්ට ස්වාමින්වහන්සේ විසින් පොරොන්දු වුනාවූ ජීවනය නම් ඔටුන්න ලබන්නේය."** (යාකොබ් 1:12) සත්‍යය වශයෙන්ම ඔබ දෙවියන්වහන්සේට ප්‍රේම කරනවාද? නැත්නම් යාච්ඤා කරනවා, නමස්කාර කරනවා, භයපත්වනවා යටහත්වනවා නමුත් මුළු හදවතින්ම ප්‍රේමකරනවාද? අප ලැබූ අලුත් ප්‍රේමය අපේ සියලු පව් මකා දෙවියන්වහන්සේ වෙතට අපව ළඟා කරයි. දෙවියන්වහන්සේ ප්‍රේමය අලුත් ලෙස සියලු දේ ලැබූ අප, අලුත් ආකාරයකින් දෙවියන්වහන්සේට ළංව ජීවත් වෙමු. මේ ප්‍රේමයත් සමඟ **"ක්‍රිස්තුස්වහන්සේ තුල තිබුණ සිතම නුඹලා තුලත් තිබේවා."** (පිලිප්පි 2:5)

**සමාප්තයි**

**බයිබල් අධ්‍යනයක් ඇසුරිනි**

ළමා පිටුව

# සිරියන් සෙන්පතියා

ආදරණීය දුවේ, පුතේ,

ඔන්න අදත් මම ඔයාලට ලස්සන කතාවක් කියල දෙන්න හදන්නේ... මේ කථාවත් හොඳින් කියවා තේරුම් ගන්න ඕනේ.

ඉතින් පුතේ, මේ කථාව සඳහන් වෙලා තියෙන්නේ ශුද්ධ බයිබලයේ 2 රාජාවලිය 5 වන පරිච්ඡේදයේ 1 පදයේ සිට 19 පදය දක්වා කොටසේ. මේ කතාව සිද්ධ වුණේ ගොඩාක් කාලයකට ඉස්සර සිරිය කියන රටේ. සිරිය රටේ හිටියා බොහෝම ශක්තිමත්, බලවත්, ගාම්භීර සේනාපතිවරයෙක්. ඔයාලා දන්නවා නේද හමුදාවේ සේනාපතිවරු හරිම ගාම්භීරයි. මේ සේනාපතිතුමාගේ නම "නාමන්" ඔහු හරිම නිර්භීත, බලසම්පන්න, මනුෂ්‍යයෙක්. ඒත් මේ සේනාපතිතුමාගේ මුළු ඇඟේම තුවාල. තුවාල තිබුණාම අපට ගොඩක් රිදෙනවා නේද? ඒවගේම නාමන් සේනාපතිතුමාටත් මුළු ඇඟම රිදුණා. තුවාල වලින් සැරව, ලේ ගැලුවා. ඒ නිසා මොනතරම් නිර්භීත, ගාම්භීර මනුෂ්‍යයෙක් වුනත් මේ නාමන් සේනාපතිතුමා හිටියේ හරිම දුකෙන්.

ඉතින් මේ නාමන් තුමා ලොකු පොහොසෙතෙක්. ඒ නිසා එයාගේ ගෙදර වැඩ කරන්න ගොඩක් සේවක, සේවිකාවෝ හිටියා. ඉතින් මේ සේවිකාවෝ අතර හිටියා ඉශ්‍රායෙල් රටෙන් අල්ලගෙන ආව පොඩි ගැහැණු ළමයෙක්. දන්නවාද දුවේ, පුතේ, හුඟක් ඉස්සර කාලේ සමහර රටවල් වෙනත් රටවල් වලට විරුද්ධව යුද්ධ කරනවා. දිනන රටේ මිනිස්සු පරදින රටේ මිනිස්සුන්ව අල්ලගෙන යනවා එයාලගේ වැඩ කරව ගන්න. ඒවගේ මේ නාමන් තුමාගේ ගෙදර වැඩ කරපු මේ කුඩා ගැහැණු ළමයත්, සිරිය රටයි ඉශ්‍රායෙල් රටයි යුද්ධ කරපු වෙලාවේ ඉශ්‍රායෙල් රට පැරදුන නිසා සිරිය රටට අරගෙන ආවා. ඉතින් මේ කුඩා ගැහැණු ළමයා මේ නාමන් තුමාගේ කුෂ්ඨ රෝගය දැනගෙන එතුමාගේ බිරිඳට මෙහෙම කිව්වා. "සේනාපතිතුමන් මගේ රටේ තියෙන සමාරිය කියන ගමේ ඉන්න දෙවියන්වහන්සේගේ දාසයා මුණ ගැසුනා නම්, එතුමාට සුවය ලබා ගන්න පුළුවන්" ඉතින් මේ පොඩි ළමයා කිව්ව කථාව තව කෙනෙක් ගිහින් නාමන් තුමාට කිව්වා. නාමන්තුමන් මේ කථාව විශ්වාස කරලා ඉශ්‍රායෙල් රටේ ඉන්න මේ දෙවියන්වහන්සේගේ දාසයාව හමුවෙන්න ගියා.

මේ දෙවියන්වහන්සේගේ සේවකයාගේ නම එලීෂා. ඉතින් නාමන් තුමා මේ එලීෂා අනාගතවාක්තෘ තුමාව මුණ ගැසීමට ආවම, ඔහු



නාමන් තුමාට පණිවිඩයක් යැව්වා. " ඔබ ගොස් යෝර්දාන් ගඟේ සත්වරක් නාන්න. එවිට ඔබේ මාංශය හරි ගැහී ඔබ සුව වන්නේය කියලා" ඒත් ඉතින් මේ කතාව ඇහුවාම නාමන්තුමාට ගොඩක් කේන්ති ගියා. නාමන්තුමා හිතන්න ඇති "මම ගොඩාක් දුර රටක ඉඳලා මේ මනුෂ්‍යයාව මුණ ගැහෙන්න ආවම මේ මනුෂ්‍යයා මාව බලන්නවත් එන්නේ නැතුව, ගිහින් ගඟක නාන්න කියන්නේ ඇයි? මම මොනතරම් උසස් සේනාපතියෙක්ද?" කියලා. ඒවගේම සේනාපතිතුමා කිව්වා "මම හිතුවේ, ඔහු ඇවිත් මගේ ළඟ ඉදලා දෙවියන්වහන්සේට යාච්ඤා කරලා, තුවාල වලට අත තියලා සුවකරයි කියලා." නාමන් තුමා මේ විදිහට කේන්තියෙන් ඉන්නකොට එතුමා එක්ක ආව සේවකයෝ එතුමට කිව්වා " සේනාපතිතුමනි, දෙවියන්වහන්සේගේ සේවකයා වෙන ලොකු දෙයක් කරන්න කිව්වා නම් ඔබ තුමා කරන්නේ නැද්ද? ඒවගේ මේ ගඟේ සත්වරක් ගිලෙන්න." කියලා. ඔන්න අන්තිමට කොහොම හරි සේනාපතිතුමා කැමති වුණා. එතුමා සත් වතාවක් වතුරේ ගිලිලා උඩට ආවම ඔහුගේ ශරීරයෙන් තුවාල ඔක්කෝම නැති වෙලා එතුමාගේ සම කුඩා ළමයෙකුගේ හම වගේ ලස්සන වුණා. නාමන් තුමාට හරිම සතුටුයි. ඉතින් නාමන් තුමා ඉක්මනටම ආපහු එලීෂා කියන දෙවියන්වහන්සේගේ සේවකයා ළඟට ගිහින් මෙහෙම කිව්වා. "දෙවියන්වහන්සේ හැර මේ මුළු පොළොවේ වෙන දෙවි කෙනෙක් නැති බව දැනගත්තෙමි."

ඉතින් බලන්න දුවේ, පුතේ, දෙවියන්වහන්සේ සිදු කල බලවත් ක්‍රියාව. ඒවගේම අපේ දෙව්පියාණන්ව දන්නේ නැති මනුෂ්‍යයන් දෙවියන්වහන්සේව පිළිගන්න විදිහ. මේ පුදුම ක්‍රියාව සිදුවීමට හේතු වුණේ කවුද කියලා මතකද? ඔව් ඒ තමයි අර කුඩා ගැහැණු ළමයා. බලන්න, මේ කුඩා ළමයා මොනතරම් දෙවියන්වහන්සේව විශ්වාස කලාද කියලා. ඇය දැනගෙන හිටියා අපේ දෙව්පියාණන්ට සියල්ල කළ හැකියි කියලා. ඒ නිසා තමයි ඇය බය නැතිව, බොහෝම නිර්භීතව කිව්වේ මගේ දෙවියන්වහන්සේට සුව කරන්න පුළුවන් කියලා. ඒ වගේම මේ කුඩා ළමයා දැනගෙන හිටියා සේනාපතිතුමා සුව වුනේ නැත්නම් ඇයට දඬුවම් ලැබෙන බව. නමුත් ඇය බොහෝම තදින් දෙවියන්වහන්සේව විශ්වාස කරලා අනෙක් අයට උන්වහන්සේ ගැන කිව්වා. පුදුමයි නේද මේ කුඩා ළමයාගේ ඇදහිල්ල ගැන. දුවේ, පුතේ, ලොකු අයගේ වගේම පුංචි ඔයාලගේ ඇදහිල්ලෙනුත් ලොකු දේවල් කරන්න පුළුවන්. දෙවියන්වහන්සේ ගැන කතා කරන්නට බය වෙන්න එපා. හැමවෙලාවෙම පුංචි ඔයාලගේ ඇදහිල්ලෙන් පුදුම දේ කරන්නට අපේ දෙව්පියාණන්වහන්සේ කැමතිව සිටින සේක. ඉතින්, පුංචි ඔයාලටත් හැම තැනදිම දෙව්පියාණන්වහන්සේ ගැන ඔයාලට තියෙන විශ්වාසය ගැන කතා කරන්නට උන්වහන්සේගේ අධික කරුණාව ලැබේවා.

**මීට ආදර,**
**ශෂිලා නැන්දා.**

## බයිබල් අධ්‍යනය

# 2 තිමෝති 4 පරිච්ඡේදය

මෙම පරිච්ඡේදය දෙස බැලීමේදී දෙවියන්වහන්සේගේ සේවකයාට අවශ්‍යය මගපෙන්වීම ලබා ගත හැක. වර්තමාන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවට සේවකයන් වන්නේ කවුද? සෑම ඇදහිලිවන්තයෙක්ම උන්වහන්සේගේ සේවකයෝය.

**මෙම පරිච්ඡේදය කොටස් දෙකකට බෙදා ගනිමු.**

01) 1 පදයේ සිට 5 පදය - සභාවට සත්‍ය ධර්මය ඉගැන්වීම හා සුභාරංචිය ප්‍රකාශ කිරීමේ වැදගත්කම

02) 6 පදයේ සිට 22 පදය - පාවුල්තුමාගේ සාක්ෂිය, වර්තමාන වාතාවරණය හා සුභාශිංසනය.

**සේවකයාට දී ඇති අණ**

01. දේව වචනය දේශනා කිරීම
02. නිතරම සේවයේ යෙදී සිටීම
03. ඉගෙන ගන්න.
04. ඉවසිලිවන්තව සිටින්න.
05. තරවටු කරන්න.
06. අවවාද කරන්න.
07. අනුශාසනා කරන්න.

**සේවකයා මුහුණ දෙන ගැටළු**

01. සාරවත් ඉගැන්වීම එපා කිරීම.
02. සාරවත් ඉගැන්වීම පිළි නොගැනීම
03. තමන් කැමති ගුරුවරුන් තෝරා ගැනීම.
04. සත්‍යය එපා කිරීම.
05. ප්‍රබන්ධවලට හැරී යාම.
06. බෙදීම් ඇති වීම.

**සේවකයාට උපදෙස්.**

01. ඉවසිලිවන්තව සිටීම.
02. සිහිකල්පනාවෙන් සිටීම.
03. දුක් ඉවසීම.
04. උනන්දුවෙන් සුභාරංචිය ප්‍රකාශ කිරීම.
05. උනන්දුවෙන් සේවය කිරීම හා එය සම්පූර්ණ කිරීම.
06. පාවුල්තුමාගේ ජීවිතය ආදර්ශයට ගැනීම.

**සේවකයාට පාවුල්තුමාගේ ජීවිතයෙන් ගත හැකි පාඩම්.**

01. යාච්ඤාවෙන් කාලය ගත කිරීම.
02. ස්වාමින්වහන්සේ දුන් සේවය යහපත් ලෙස අවසන් කිරීම.
03. සාර්ථක සේවකයකු ලෙස ජීවත් වීම.
04. ඇදහිල්ල ආරක්ෂා කිරීම.
05. මරණින් පසු තිබෙන බලාපොරොත්තුව තදින් අල්ලාගෙන සිටීම.
06. ස්වාමින්වහන්සේගෙන් විපාකය බලාපොරොත්තුවෙන් සිටීම.
07. එකිනෙකාට සමාව දී පිළිගැනීම
08. තවත් ඉගෙන ගැනීමට ආශා කිරීම. (පොත් පත් පිළිබඳ ඇති ආශාව)
09. නපුරුකම් ඉවසීම.
10. තමන් විරුද්ධ වූ අය ගැන සිතේ තරහක් නොතබා ගැනීම.
11. ස්වාමින්වහන්සේ තමන්ට කළ සෑම දේ ගැන සාක්ෂි දැරීම
12. නිතරම දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීම.

**- එස්. මෙත්තානන්ද -**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

පෙ.ව 8.15 - 9.15 - ඉරිදා පාසැල
අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා

පෙ.ව 9.30 - 12.00 - රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල , දෙමළ , ඉංග්‍රීසි)

ප.ව 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම - (සිංහල)

ප.ව. 6.00 - 7.00 - සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව 6.30 - 7.30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව 6.00 - 7.30 - යාච්ඤා රැස්වීම
අසනීප අය සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම

## සිකුරාදා

ප.ව 6.00 - 7.30 - බයිබල් අධ්‍යයනය

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2581901 / 077 8813197
www.christianfellowshipcentre.com

NMA GRAPHICS
No. 246/A, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com